# 4.2.5-(පරාක්‍රම නිරිඇල්ල)



**උපත :-** 1949. රත්නපුර, නිරිඇල්ල, ශ්‍රී ලංකා

**අධ්‍යාපනය:-** දිවුලපිටිය හුණුමුල්ල මධ්‍ය මහා විද්‍යාලය, පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙන් අධ්‍යාපනය

**රැකියාව:-** නාට්‍ය රචක, අධ්‍යක්ෂක,සිනමා හා ටෙලි නාට්‍ය නිර්මාණකරු

**වෘත්තීය තොරතුරු:-** ලඝු ලේඛක, රූපවාහිනී වැඩසටහන් නිශ්පාදක

**ජීවන තොරතුරු:-** මෙතුමා කෘතහස්ත නාට්‍යකරුවෙකු ලෙස හඳුනා ගත හැක. වේදිකාවේ නවතාවයන් සොයා පරීක්ෂණ කාර්යයයේ නිරත වූ නාට්‍යකරුවෙකි. එම නිසා ඔහු නාට්‍යකරුවෙකු, සිනමාකරුවෙකු ලෙස ප්‍රකට ප්‍රවීණ කලාකරුවෙකි .ගාමිණී හත්තොට්ටුවේගම මහතා සමග එක්ව කටයුතු කිරීම මඟින් ජනකරළිය නාට්‍ය කණ්ඩායම බිහිවීමත් එහි ආකෘතියේ නිර්මාතෘවරයා ලෙසත් මෙතුමා නම් කළ හැකිය. සිරිමැදුර, අයෝමා සිනමාපට සහ චරන්දාස්, මැටි කරත්තය, සෙක්කුව වැනි වේදිකා නාට්‍ය ඔහුගේ නිර්මාණාවලියේ සුවිශේෂී සංධිස්ථානයන්ය . ජනකරළිය ආකෘතිය පිළිබඳවත්, සෙක්කුව වේදිකා නාට්‍යය පිළිබඳවත් ප්‍රවීණ නාට්‍යවේදී සහ සිනමාවේදී පරාක්‍රම නිරිඇල්ල
හැඳින්විය හැක.

❖ **ඔහුගේ නාට්‍ය නිර්මාණ:-**

- 1976 සෙක්කුව - රචනය සහ අධ්‍යක්ෂණය
- 1979 විනිශ්චය - පරිවර්තනය සහ අධ්‍යක්ෂණය (ඇල්බෙයා කැමූ ලියූ ඔයැ වම්එ) හි පරිවර්තනය
- 1984 ගැලීලියෝ - අධ්‍යක්ෂණය -පරාක්‍රම නිරිඇල්ල සහ එච්.ඒ. පෙරේරා (පරිවර්තනය නීල් ශ්‍රී විජේසිංහ)
- 1989 උත්තමාවී - අධ්‍යක්ෂණය -පරාක්‍රම නිරිඇල්ල (පරිවර්තනය නීල් ශ්‍රී විජේසිංහ)
- 1995 වරෙන්තු - අධ්‍යක්ෂණය -පරාක්‍රම නිරිඇල්ල සහ එච්.ඒ. පෙරේරා (පරිවර්තනය එච්.ඒ. පෙරේරා)

පරාක්‍රම නිරිඇල්ල, එච්.ඒ. පෙරේරා සමග සම්බන්ධ ව ආරම්භ කළ ජන කරළිය / ජංගම රඟමඬල ආරම්භ කිරීමත් සමග නිෂ්පාදනය කළ නාට්‍ය

- අන්දර මල්
- සීතාම්බර පට
- මකරරාක්ෂ (එව්ගිනි ෂ්වාත්ස් ගේ ''ද ඩ්‍රැගන්'' හි පරිවර්තනය)
- චරන්දාස් (ඉන්දීය නාට්‍ය හබීබ් තන්විල් චරන්දාස් චෝර් හි පරිවර්තනය)
- මැටි කරත්තය (ශුද්‍රකගේ මෘච්ඡකටික ප්‍රකරණය)
- කල්පාන්තයො

# ජන කරලිය







ලංකාවේ නාට්‍ය කලාවේ සම්මත රංගන ක්‍රම වෙනස් කර ජනකරළිය ජංගම රඟ මඬල ආරම්භ කිරීම සහ ගාමිණී හත්තොටුවේගම සමග මූලික වී වීදි නාට්‍ය කලාව ද ආරම්භ කළේය. මෙම ජනකරලියේ විශේෂත්වය වන්නේ ජංගම රඟහලක් වූ මෙහි එකවර 800 කට පමණ පහසුවෙන් අසුන් ගෙන නැරඹිය හැකි වීමයි. මෙමගින් සිංහල,දෙමළ මුස්ලිම් ආදි ජාතීන් එක්ව අන්‍යෝන්‍ය සංහිදියාව වර්ධනය කරමින් භාෂා ද්විත්යෙන්ම නාට්‍ය පැවැත්විණි.

## 1976 සෙක්කුව

තාත්වික ශෛලිය හා කෝලම් , සොකරි ජන නාට්‍යය හා ජන කවි ජන කලාවේ සම්මිශ්‍රණයෙන් නිපදවූ සෙක්කුව, පීඩනය, අසහනය, ණය බර, රැවටීම නිසා ජනයාගේ ස්වාධිනත්වය හා නිදහස අහිමි වී ඔවුන් සූරා කෑමට ලක්වී වහලුන් බවට පත් වීමේ ක්‍රියා වලිය මෙහි වස්තු විෂයයි.



- ❖ ඔහුගේ ටෙලි නාට්‍ය නිර්මාණ:-
    - ළාහිරු දහසක්
    - යශෝරාවය
    - සඳගිරි පවුව

- සුදෝසුදු
- මිහිමඩ ගිනි වදියි

❖ ඔහුගේ චිත්‍රපට නිර්මාණ:-

- සිරිමැදුර
- අයෝමා

පරාක්‍රම නිරිඇල්ල නම් වු සොදුරු කලාකරුවා වේදිකාව, රූපවාහිනිය, සිනමාව යන මාධ්‍ය ත්‍රිත්වයේම විශිෂ්ට නිර්මාණකරණයක නිරත අව්‍යාජ කලාකරුවෙක් ලෙස නම් කළ හැකිය.